සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 - 40 තෙක් ප්‍රශ්නවලට **(1) (2) (3) (4)** පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්ත ආයතන කීපයක කළමනාකරුවෙක් ලෙස සේවයේ යෙදී එයින් ඉවත් වූ සිසිල් සිරිවර්ධන මහතා කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදිත අපනයනය කරන ව්‍යාපාරයක් ''සිසිල් කොකෝ ප්‍රඩක්ට්ස්'' නමින් ඔහුගේම ඉඩමක ආරම්භ කරන ලදී. විදේශ රටවලින් ලැබෙන ඇණවුම් අනුව නිෂ්පාදන කටයුතු සිදුකළ අතර ඒ සඳහා සේවකයන් 20 දෙනෙකුගේ සේවය ලබා ගනියි. ව්‍යාපාර කටයුතු සඳහා රු. 1,000,000 ණයක් සිසිලගම ණයදෙන සමූපාකාර සමිතියෙන් ලබා ගන්නා ලදී.

01 කොහු කෙඳි අයත් වන නිෂ්පාදන සාධකය වන්නේ,

(1) භූමිය (2) ප්‍රාග්ධනය (3) ව්‍යවසාය (4) ශ්‍රමය

02 ''සිසිල් කොකෝ ප්‍රඩක්ට්ස්'' ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් සාධකයක් වන්නේ,

(1) අයිතිකරු සිසිල් සිරිවර්ධන (2) සේවකයන් 20 දෙනා

(3) සිසිලගම ණයදෙන සමූපාකාර සමිතිය (4) කර්මාන්තශාලාව පිහිටි ඉඩම

03 විදේශ රටවලින් ඇනවුම් ලැබීම ''සිසිල් කොකෝ ප්‍රඩක්ට්ස්'' ව්‍යාපාරයට

(1) ශක්තියකි. (2) දුර්වලතාවකි. (3) තර්ජනයකි. (4) අවස්ථාවකි.

04 'සිසිල් කොකෝ ප්‍රඩක්ට්ස්'' ව්‍යාපාරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුය. (2) නෛතික පුද්ගල භාවයක් ඇත.

(3) අයිතිකරුගේ වගකීම සීමිතය. (4) තීරණ ගැනීමේ ස්වාධීනත්වයක් නැත.

05 සිසිලගම සමූපකාර ණය දෙන සමිතිය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයේ අවාසියකි,

(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම. (2) සමූපාකාර ප්‍රතිපත්ති මතම කටයුතු කිරීම.

(3) විවිධ රාජ්‍ය අනුග්‍රහයන් හිමි වීම. (4) ආර්ථික ප්‍රතිලාභ සාමාජිකයන් අතර බෙදීම.

06 පහත දැක්වෙන්නේ අවශ්‍යතා හා වුවමනා වල ලක්ෂණ කීපයකි,

A - නිර්මාණය කළ නොහැකි වීම. B - විවිධ වීම.

C - අත්‍යවශ්‍ය නොවීම. D - සංකීර්ණ නොවීම.

ඉහත ලක්ෂණ අතරින් වුවමනාවල ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) B සහ D පමණි. (4) C සහ D පමණි.

07 ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයක් ලෙස රජය ව්‍යාපාර වලින් අපේක්ෂිත අරමුණක් වන්නේ,

(1) රැකියා අවස්ථා උත්පාදනය කිරීම. (2) ආයෝජන පිළිබඳ තීරණ ගැනීම.

(3) ව්‍යාපාරයේ අනාගත වර්ධනය. (4) නිෂ්පාදිත වල මිල තීරණය කිරීම.

08 'ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාව අපනයනය කරන භාණ්ඩ සඳහා පනවා තිබූ බද්ද ඉහළ නංවයි' මෙම පුවත අදාල පරිසර බලවේගය වන්නේ,

(1) ආර්ථික පරිසරය (2) ගෝලීය පරිසරය (3) තාක්ෂණික පරිසරය (4) දේශපාලන පරිසරය

09 ව්‍යාපාර නාම හා ව්‍යාපාර සංවිධාන වර්ග කීපයක් පහත දැක්වේ.

(1) මාර්ග සංවර්ධන අධිකාරිය A - සංස්ථාපිත සමාගම්

(2) ශක්ති ක්‍රීඩා සමාජය B - රාජ්‍ය සංස්ථා

(3) සී/ස සවිය පොදු සමාගම C - හවුල් ව්‍යාපාර

(4) පෙරේරා සහ සහෝදරයෝ D - සමිති සංවිධාන

ඉහත ව්‍යාපාර නාම දී ඇති අනුපිළිවෙලට අනුව ව්‍යාපාර සංවිධාන වර්ග සමඟ නිවැරදිව ගැලපෙන ලද පිළිතුර තෝරන්න.

(1) BDAC (2) BDCA (3) DBAC (4) DBCA

Past Papers Wiki

10 ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් ලක්ෂණ පහත දැක්වේ.

- අඛණ්ඩ පැවැත්මක් තිබීම.
- නෛතික පුද්ගලභාවයක් තිබීම.
- හිමිකම පෞද්ගලික හා රාජ්‍ය අංශය සතුවීම.

ඉහත ලක්ෂණ වලට අදාල විය යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) දෙපාර්තමේන්තු (2) සංස්ථා (3) සමාගම් (4) සමූපකාර

11 ලාභ ලැබීමේ අරමුණක් සහිත ව්‍යාපාරයක් වනුයේ,

(1) ලංකා වැවිලි සමාගම

(2) දුම්රිය දෙපාර්තමේන්තුව

(3) 'පැරකුම්' ගොවි සමිතිය

(4) ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය

12 ව්‍යාපාර ලියාපදිංචි කිරීම සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සෑම ව්‍යාපාරයක්ම ලියාපදිංචි කිරීම තුළින් නීතිමය පුද්ගලභාවයක් ලැබේ.

(2) සමාගමක් සංස්ථාපනය කිරීම තුළින් නීතිමය පුද්ගලභාවය හිමිවේ.

(3) ව්‍යාපාර කටයුතු වල නිරත සෑම ව්‍යාපාරයක්ම ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

(4) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් නීතිමය පුද්ගලභාවය හිමිවේ.

13 අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අගය හැඳින්වෙන්නේ,

(1) වගකීම් ලෙසය. (2) වියදම් ලෙසය. (3) හිමිකම් ලෙසය. (4) වත්කම් ලෙසය.

14 පහත ගනුදෙනු අතරින් අයිතිකරුගේ හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ,

(1) රු. 200 000 ක් වටිනා උපකරණ මිලට ගැනීම. (2) රු. 20 000 ක කුලී ආදායමක් ලැබීම.

(3) රු. 50 000 ක බැංකු ණයක් ගැනීම. (4) අයිතිකරු රු. 10 000 ක ගැනිලි සිදුකිරීම.

15 2025.01.01 දිනට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
500 000	=	355 000	+	145 000

අයිතිකරු සිය පෞද්ගලික මුදලින් රු 25 000 ක ණයහිමියන් පියවූ පසුව ගිණුම්කරණ සමීකරණය වන්නේ,

(1) 475 000 = 355 000 + 120 000 (2) 450 000 = 330 000 + 120 000

(3) 475 000 = 330 000 + 145 000 (4) 500 000 = 380 000 + 120 000

16 වැඩි වීම ''බැර'' අඩු වීම ''හර'' යන ගිණුම්කරණ රීතිය අදාළ වන ගිණුම වන්නේ,

(1) ගැනුම් ගිණුම (2) රක්ෂණ ගාස්තු ගිණුම (3) ලද වට්ටම් ගිණුම (4) ණය ගැති ගිණුම

17 ගනුදෙනුවක් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන පහත පරිදි වේ.

බැංකු ණය ගිණුම	-	හර	30 000
මුදල් ගිණුම	-	බැර	30 000

මෙම ගනුදෙනුව වන්නේ,

(1) රු. 30 000 ක බැංකු ණයක් ගැනීම. (2) රු. 30 000 ක බැංකු ණය පොලී ගෙවීම.

(3) රු. 30 000 ක ණයහිමියෙකු පියවීම. (4) රු. 30 000 ක බැංකු ණය වාරිකය ගෙවීම.

18 රු. 2 000 ක ලද පොලී සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1)

මුදල් ගිණුම - හර	2 000	
ලද පොලී ගිණුම - බැර		2 000

(2)

ලද පොලී ගිණුම - හර	2 000	
මුදල් ගිණුම - බැර		2 000

(3)

මුදල් ගිණුම - හර	2 000	
ණය හිමි ගිණුම - බැර		2 000

(4)

ලද පොලී ගිණුම - හර	2 000	
ණය ගැති ගිණුම - බැර		2 000

19 පහත ප්‍රකාශ අතරින් ලෙජරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ගනුදෙනු ප්‍රථමයෙන්ම සටහන් තබනුයේ ලෙජරයේ ය.

(2) වත්කම, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් යනාදී ගිණුම් සියල්ලෙහිම එකතුව ලෙජරය වේ.

(3) සියලු මූලික සටහන් පොත්වල එකතුව ලෙජරය වේ.

(4) ව්‍යාපාරයේ ගනුදෙනු සාරාංශ කිරීමට ලෙජරය යොදා ගැනේ.

20 ලිහිණී තම ව්‍යාපාරයට රු. 200 000 ක් වටිනා යන්ත්‍රයක් මිලට ගෙන චෙක්පතකින් මුදල් ගෙවන ලදී. මෙහිදී එම මුදල් ගෙවීමට අදාළ මූලාශ්‍ර ලේඛනය වනුයේ,

(1) ලදුපත (2) පිළිපත (3) ඉන්වොයිසිය (4) බැරපත

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 21 හා 22 ට පිළිතුරු සපයන්න.**

ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ නිරත ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කීපයක් හා මූලාශ්‍ර ලේඛන කීපයක් පහත දැක්වේ.

ගනුදෙනුව	මූලාශ්‍ර ලේඛනය
1. ණයට ගැනුම් රු. 60 000	A - ජ'නල් වවුචරය
2. බැංකු ණයක් ලැබීම රු. 50 000	B - ගැනුම් ඉන්වොයිසිය
3. චාමරට ණයට විකුණුම් 30 000	C - ලදුපත
4. ව්‍යාපාරයේ භාවිතයට යන්ත්‍රයක් ණයට ගැනීම රු. 75 000	D - විකුණුම් ඉන්වොයිසිය

21 ඉහත දී ඇති ගනුදෙනු අනුපිළිවෙල අනුව මූලාශ්‍ර ලේඛන නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) BCAD (2) BADC (3) BCDA (4) DCBA

22 ඉහත ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලික සටහන් පොත් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් පොත
(2) ගැනුම් ජ'නලය, මුදල් පොත, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය
(3) විකුණුම් ජ'නලය, මුදල් පොත, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය
(4) විකුණුම් ජ'නලය, පොදු ජ'නලය, ගැනුම් ජ'නලය, මුදල් පොත

23 අසිතගේ ව්‍යාපාරයේ 2025/03/31 දිනට පිළියෙල කළ බැංකු ගිණුමේ බැර ශේෂය රු. 18 000 කි. මෙය,

(1) ව්‍යාපාරයේ වත්කමකි (2) ව්‍යාපාරයේ වගකීමකි
(3) ව්‍යාපාරයේ වියදමකි (4) බැංකුවේ වගකීමකි

24 ණයහිමියෙකු වූ රංගට රු. 10 000 ක චෙක්පතක් නිකුත් කරන ලදී. එම ගනුදෙනුව සඳහා තැබිය යුතු නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1)	ණයහිමි රංගගේ ගිණුම	- හර	10 000	(2)	ණයහිමි රංගගේ ගිණුම	- හර	10 000
	මුදල් ගිණුම	- බැර	10 000		බැංකු ගිණුම	- බැර	10 000
(3)	බැංකු ගිණුම	- හර	10 000	(4)	මුදල් ගිණුම	- හර	10 000
	ණයහිමි රංගගේ ගිණුම	- බැර	10 000		බැංකු ගිණුම	- බැර	10 000

- **පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 25 - 26 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

2025/03/31 දිනට බැංකු ගිණුමේ ශේෂය 21 000 කි. නමුත් පහත හේතු නිසා එදිනට බැංකු ප්‍රකාශණයේ ශේෂය ඊට සමාන නොවීය.

A - ණයගැති සෘජු ප්‍රේශණ රු. 5 000
B - ස්ථාවර නියෝග මත ගෙවා ඇති ණය වාරිකය රු. 4 000
C - නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 10 000

25 ඉහත හේතු අතුරෙන් බැංකු සැසඳුමට ඇතුළත් කළ යුතු හේතුව / හේතු වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) C පමණි.

26 2025/03/31 දිනට සංශෝධිත බැංකු ශේෂය වන්නේ,

(1) රු. 16 000 කි. (2) රු. 20 000 කි. (3) රු. 22 000 කි. (4) රු. 30 000 කි.

27 ගිණුම්වල සටහන් නොකරන, නමුත් මූලාශ්‍ර ලේඛන වල පමණක් සටහන් කරනු ලබන වට්ටම් වර්ගය වන්නේ,

(1) දුන් වට්ටම් (2) ලද වට්ටම් (3) මුදල් වට්ටම් (4) වෙළඳ වට්ටම්

- **පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 28 සහ 29 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අමල්ගේ ව්‍යාපාරයේ 2025 මාර්තු මාසයේ සුළු මුදල් ගෙවීම් වල විශ්ලේෂණය පහත දැක්වේ.

ලිපිද්‍රව්‍ය	3 000
සංග්‍රහ වියදම්	4 000
ගමන් වියදම්	3 500
විවිධ වියදම්	2 500

මාර්තු 31 දිනට අත ඉතිරි සුළු මුදල් ශේෂය රු. 2 000 කි.

28 මෙම ව්‍යාපාරයේ 2025 මාර්තු මාසයේ සුළු මුදල් වියදම කොපමණ ද?

(1) රු. 3 000 කි. (2) රු. 10 500 කි. (3) රු. 13 000 කි. (4) රු. 15 000 කි.

29 මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?

(1) රු. 2 000 කි. (2) රු. 10 500 කි. (3) රු. 13 000 කි. (4) රු. 15 000 කි.

30 නිමි ඇඳුම් අලෙවි කිරීමේ නිරත ව්‍යාපාරයක්, අලෙවි කිරීම සඳහා නිමි ඇඳුම් ණයට මිලදී ගත් විට සටහන් කළ යුතු මූලික පොත හා මූලාශ්‍ර ලේඛන වන්නේ,

(1) ගැනුම් ජ'නලය හා ගැනුම් ඉන්වොයිසිය (2) පොදු ජ'නලය හා ජ'නල් වවුචරය
(3) ගැනුම් ජ'නලය හා ගෙවීම් වවුචරය (4) පොදු ජ'නලය හා ගෙවීම් වවුචරය

31 ගැනුම් ජ'නලයේ එකතුව,

(1) ගැනුම් ගිණුමට - බැර කරයි (2) ගැණුම් ගිණුමට - හර කරයි
(3) ණයහිමි ගිණුමට - හර කරයි (4) ණයගැති ගිණුමට - බැර කරයි

32 විකුණුම් ජර්නලය,

(1) ලෙජර් ගිණුමකි. (2) මූලික සටහන් පොතකි.
(3) මූලාශ්‍ර ලේඛනයකි. (4) මූල්‍ය ප්‍රකාශනයකි.

33 අත්කම් නිර්මාණ නිෂ්පාදන ව්‍යාපාරයක විකුණුම් ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනුව තෝරන්න.

(1) අත්කම් නිර්මාණ ණයට විකිණීම රු. 25 000.

(2) අත්කම් නිර්මාණ අත්පිට මුදලට විකිණීම රු. 45 000.

(3) අත්කම් නිර්මාණ සැකසීමේ යන්ත්‍රය ණයට විකිණීම රු. 65 000.

(4) අත්කම් නිර්මාණ සඳහා ණයට ගත් රෙදි තොගයක් අත්පිට මුදලට විකිණීම රු. 55 000.

34 කලණගේ ව්‍යාපාරයේ ජනවාරි මාසය සඳහා පිළියෙල කළ විකුණුම් ජර්නලය පහත පරිදි වේ.

විකුණුම් ජර්නලය

දිනය	ඉ.අ.	ගැනුම්කරු	වටිනාකම (රු.)	ලෙ.පි.
01/10	10	අරවිඳු	40 000	
(A)		(B)	40 000	

ඉහත විකුණුම් ජර්නලයේ (A) හා (B) යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 01/10, විකුණුම් ගිණුමට බැර කළා

(2) 01/10, අරවිඳුගේ ගිණුමට බැර කළා

(3) 01/31, අරවිඳුගේ ගිණුමට බැර කළා

(4) 01/31, විකුණුම් ගිණුමට බැර කළා

35 කලසිගේ ව්‍යාපාරයෙන් සඳුප්‍රභා රු. 10 000 ක භාණ්ඩ ණයට ගන්නා ලදී. එම ගනුදෙනුව කලසිගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) ගැනුම් ගිණුම හර රු. 10 000
සඳුප්‍රභා ගිණුම බැර රු. 10 000

(2) සඳුප්‍රභා ගිණුම හර රු. 10 000
විකුණුම් ගිණුම බැර රු. 10 000

(3) විකුණුම් ගිණුම හර රු. 10 000
මුදල් පොත බැර රු. 10 000

(4) විකුණුම් ගිණුම හර රු. 10 000
රොෂාන් ගිණුම බැර රු. 10 000

36 ව්‍යාපාරයක සිදු වී ඇති පහත ගනුදෙනු අතුරෙන් පොදු ජ'නලයේ සටහන් කළ යුතු ගනුදෙනුව තෝරන්න.

(1) රු. 10 000 ක භාණ්ඩ නෙත්මිට ණයට විකිණීම.

(2) රු. 5 000 ක් විදුලි ගාස්තු ලෙස ගෙවීම.

(3) රු. 8 000 ක භාණ්ඩ බිනුර ව්‍යාපාරයෙන් ණයට ගැනීම.

(4) රු. 20 000 ක ලී බඩු ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ගැනීම.

37 ලෙජරයේ ඇති ගිණුම්, බෙදා දැක්විය හැකි ගිණුම් වර්ග ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

38 ශේෂ පිරික්සුම තුලනය වීම කෙරෙහි බලපෑමක් ඇති නොකරන වරදක් වන්නේ,

(1) රු. 40 000 ක ලී බඩු මිලදී ගැනීම, ලී බඩු ගිණුමට පිටපත් නොකිරීම.

(2) රු. 10 000 ක වැටුප් ගිණුමේ ශේෂය, ශේෂ පිරික්සුමට පිටපත් නොකිරීම.

(3) ණයහිමියෙකුට ගෙවන ලද රු. 5 000 ණයහිමි ගිණුමේ බැර පැත්තේ සටහන් කිරීම.

(4) ණයගැතියෙකුගෙන් ලද රු. 5 000 පොත්වල දෙවරක් සටහන් කිරීම.

39 දුරකථන ගාස්තු වශයෙන් ගෙවන ලද රු. 1 000 එම ගිණුමේ බැර පැත්තේ සටහන් කිරීමේ වරද නිවැරදි කිරීමට අදාළ ගිණුම් සටහන වන්නේ,

(1) දුරකථන ගාස්තු ගිණුම හර රු. 1 000
අවිනිශ්චිත ගිණුම බැර රු. 1 000

(2) දුරකථන ගාස්තු ගිණුම හර රු. 1 000
මුදල් ගිණුම බැර රු. 1 000

(3) දුරකථන ගාස්තු ගිණුම හර රු. 2 000
අවිනිශ්චිත ගිණුම බැර රු. 2 000

(4) අවිනිශ්චිත ගිණුම හර රු. 2 000
දුරකථන ගාස්තු ගිණුම බැර රු. 2 000

40 වර්තමානයේ මුදල් ගනුදෙනු පහසුවෙන් සිදු කර ගැනීම සඳහා ජංගම දුරකථනය හා පරිගණකය බහුලව යොදා ගනියි. ඒ සඳහා අත්‍යවශ්‍යම තවත් සාධකයකි,

(1) විද්‍යුත් තැපෑල (2) ATM පත (3) හරපත (4) අන්තර්ජාලය

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II** | **කාලය පැය 2 යි**

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව **I** කොටසින් ප්‍රශ්න දෙකක්ද, **II** කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01. පහත සිද්ධිය ඇසුරෙන් (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අනුජගේ පියා දොර ජනෙල් තිර රෙදි නිර්මාණය කිරීමේ ව්‍යාපාරයක් ''සරිත්මා'' නමින් පවත්වාගෙන යන ලදී. අනුජ ද, පියාගේ ''සරිත්මා'' හි සේවය කරමින් දොර ජනෙල් තිර රෙදි නිපදවීම පිළිබඳ මනා දැනුමක් හා පළපුරුද්දක් ලබා ගන්නා ලදී. පියාගෙන් පසුව එම ව්‍යාපාරය අනුජ විසින් පවත්වාගෙන යන අතර, නවීන ලෝකයට ගැළපෙන නව මෝස්තර අනුව තිර රෙදි නිපදවීම නිසා ඔහුගේ නිෂ්පාදිතවලට ඉහළ ඉල්ලුමක් පවතියි. ඔහු සිය ව්‍යාපාරය ''සීමාසහිත සරිත්මා සමාගම'' ලෙස ලියාපදිංචි කිරීමට අදහස් කරගෙන සිටියි.

2025/01/01 දිනට මෙම ව්‍යාපාරයේ පහත ගිණුම් වල ආරම්භක ශේෂ පැවතිණ.

ඉඩම් ගොඩනැගිලි	රු.	2 000 000
මෝටර් රථය	රු.	1 500 000
බැංකු ණය	රු.	800 000
තොගය	රු.	300 000
මුදල්	රු.	175 000
යන්ත්‍ර	රු.	250 000
ණයහිමියෝ	රු.	60 000

2025/01/31 න් අවසන් මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

අමුද්‍රව්‍ය අත්පිට ගැනුම්	රු.	180 000
අමුද්‍රව්‍ය ණයට ගැනුම්	රු.	250 000
අත්පිට විකුණුම්	රු.	420 000
සේවක වැටුප්	රු.	175 000
ණයහිමියන්ට ගෙවීම්	රු.	45 000
බැංකු ණය පොලී	රු.	6 000
විවිධ වියදම්	රු.	65 000

(i) (අ) ''සරිත්මා'' ව්‍යාපාරය, නිෂ්පාදිතවල ස්වභාවය අනුව කුමන ව්‍යාපාර වර්ගයට අයත් වේද?

(ආ) ''සරිත්මා'' හි ව්‍යාපාර පරිසරය තුළ අනුජ අයත්වන පරිසර සාධකය කුමක් ද? ව්‍යාපාර පරිසරය වර්ග කිරීමේදී එය අයත්වන්නේ කුමන කොටසට ද?

(ii) ''සරිත්මා'' ව්‍යාපාරය ලියාපදිංචිය පිළිබඳ ඔබේ අදහස හේතු සහිතව ඉදිරිපත් කරන්න.

(iii) (අ) ''සරිත්මා'' ව්‍යාපාරයේ ශක්තියක් ලියා දක්වන්න.

(ආ) ''සරිත්මා'' ව්‍යාපාරයේ අවස්ථාවක් ලියා දක්වන්න.

(iv) (අ) සාපේක්ෂව ''සීමාසහිත සරිත්මා සමාගමේ'' වාසි දෙකක් ලියා දක්වන්න.

(ආ) ''සීමාසහිත සරිත්මා සමාගමේ'' ලියාපදිංචි කිරීමේ බලධරයා දක්වන්න.

(v) ''සරිත්මා'' ව්‍යාපාරයේ 2025/01/01 දිනට හිමිකම ගණනය කරන්න.

(vi) මෙම ව්‍යාපාරයේ 2025/01/01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව දක්වන්න.

(vii) (අ) බැංකු ණය පොළී ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(ආ) එය ගිණුම් ගත කර පෙන්වන්න.

(viii) (අ) ණයට ගැනුම් සටහන් කළ යුතු මූලික සටහන් පොත හා මූලාශ්‍ර ලේඛනය දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ ජංගම වත්කමක් සහ ජංගම නොවන වත්කමක් ලියා දක්වන්න.

(ix) මෙම ව්‍යාපාරයේ 2025/01/31 දිනට ණයහිමි ගිණුම දක්වන්න.

(x) ''සරිත්මා'' ව්‍යාපාරයේ 2025/01/31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ලකුණු 2× 10 = 20)

I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) (අ) ව්‍යාපාරයක් යන්න නිර්වචනය කරන්න.

(ආ) ව්‍යාපාරයක පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණු 01 ක් ලියන්න. (ල.02)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාර කටයුතු කරන්නේ ලාභ අපේක්ෂාවෙන් පමණි.

(ආ) වුවමනා ආර්ථික හා සමාජීය තත්ත්ව අනුව වෙනස් වේ.

(ඉ) සිල්ලර වෙළඳ ආයතන සේවා නිෂ්පාදන ව්‍යාපාර වේ.

(ඊ) නිවැරදි තීරණ ගැනීම කළමනාකරුවන්ගේ ව්‍යාපාර අපේක්ෂිත දායකත්වයකි. (ල.½ x 4 = 2)

(iii) සමුද්‍ර විසින් ''සමුද්‍ර බේකරි'' නමින් පළාත් සභාවේ ලියාපදිංචි කරමින් බේකරියක් අරම්භ කරන ලදී. ඒ සඳහා සේවකයන් 02 බඳවා ගත් අතර බැංකුවකින් ණයක් ලබා ගන්නා ලදී.

(අ) සමුද්‍ර බේකරිය ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු නිලධාරියා සහ ආයතනය නම් කරන්න.

(ආ) ''සමුද්‍ර බේකරි'' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව 02 ක් නම් කරන්න. (ල.02)

(iv) පතල් සේවකයන්ට මිනිරන් ආකර වල මිනිරන් කැණීම පහසු කිරීම සඳහා පතල් හිමිකරුවා වන රංගනාථ මහතා විසින් නව යන්ත්‍රයක් හඳුන්වා දී ඇත. ඉහත සිද්ධිය තුළ ඇතුළත් නිෂ්පාදන සාධක වන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායට උදාහරණ දක්වන්න. (ල.02)

(මුළු ලකුණු 08)

03. (i) (අ) ව්‍යාපාර පරිසරය යනු කුමක් ද?

(ආ) ව්‍යාපාර පරිසරය වර්ග කර දක්වන්න. (ල.02)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ඇතැම් ව්‍යාපාර වල අයිතිකරුවන්ම කළමනාකරුවෝ වෙති.

(ආ) තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම තර්ජනයකි.

(ඉ) බාහිර පරිසර සාධක ව්‍යාපාරයට අවශ්‍ය පරිදි පාලනය කළ නොහැක.

(ඊ) රජය නීති රීති පනවන්නේ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට පමණි. (ල.02)

(iii) උද්ධමනය පාලනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 4% බැංකු ණය පොලී අනුපාතය ඉහළ දමන ලදී.

(අ) ඉහත සිද්ධිය තුළ සඳහන් ''උද්ධමනය සහ බැංකු පොලී අනුපාතය'' කුමන ව්‍යාපාර පරිසර බලවේගයට අයත් ද?

(ආ) උද්ධමනය යනු කුමක් ද? (ල.02)

(iv) (අ) ගෝලීයකරණය යනු කුමක් ද?

(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් වන හිතකර බලපෑම් සහ අහිතකර බලපෑම් එක බැගින් ලියන්න. (ල.02)

(මුළු ලකුණු 08)

04. (i) හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග වී ඇති ආකාරය උදාහරණ එකක් සහිතව දක්වන්න. (ල.02)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) වෙළෙඳපොළ කොටස යනු, ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව වර්ග කෙරෙන නිර්ණායකයකි.

(ආ) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වේ.

(ඉ) 1890 හවුල් ආඥා පනතින් හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම සාමාජික සංඛ්‍යාව තීරණය කර ඇත.

(ඊ) සමූපකාර වලට රජයේ වාර්ෂික අයවැය ලේඛනය මඟින් අවශ්‍ය අරමුදල් වෙන් කෙරේ. (ල.02)

(iii) සහන් ව්‍යාපාර පරිපාලන දක්ෂතා ඇති ස්වාධීන තීරණ ගැනීමට කැමති, අවදානම් කළමනාකරණ හැකියාව ඇති, පුද්ගලයෙකි. ලවන් සමූහයක් සමඟ කටයුතු කිරීමට කැමති, සාකච්ඡා කර තීරණ ගැනීමට කැමති අයෙකි.

(අ) සහන්ට සහ ලවන්ට යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ග 02 නම් කරන්න.

(ආ) ලවන් ආරම්භ කිරීමට කැමති ව්‍යාපාර සංවිධාන වර්ගය ආරම්භ කිරීමට සුදුසු වෘත්තීන් 02 ක් නම් කරන්න. (ල.02)

(iv) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට සංවිධානය කළ හැකි විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන ඇත.

(අ) ව්‍යාපාරිකයන් විසින් ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැළකිල්ලට ගනු ලබන සාධක 02 ක් නම් කරන්න.

(ආ) ව්‍යාපාරයක පරිමාණය තීරණය කිරීමේදී සළකා බලන සාධක 02 ක් නම් කරන්න. (ල.02)

(මුළු ලකුණු 08)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05. (i) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද? (ල.02)

(ii) වත්කමක ලක්ෂණ දෙකක් ලියන්න. (ල.02)

(iii) ගෘහ භාණ්ඩ අලෙවිකිරීමේ ව්‍යාපාරයක 2025 මාර්තු 31 න් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

(1) රු. 50 000 ක බැංකු ණයක් ගැනීම.

(2) රු. 10 000 ක් ණයගැතියන්ගෙන් ලැබීම.

(3) රු. 25 000 ක වෙළඳ භාණ්ඩ (ගෘහ භාණ්ඩ) තොගයක් ණයට ගැනීම.

(4) රු. 15 000 ක භාණ්ඩ තොගයක් 20 000 කට අත්පිට මුදලට විකිණීම.

(5) අයිතිකරු රු. 2 000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට ඇතුළත් කිරීම (+ / (-) ලකුණ සහිතව) (පහත දක්වා ඇති ආකෘතිය භාවිත කරන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.)

ගනුදෙනු අංක	වත්කම්				හිමිකම	+ වගකීම්	
	යන්ත්‍ර	තොගය	ණයගැති	මුදල්		බැංකු ණය	ණයහිමි
2025/3/1 දිනට ශේෂය	150 000	40 000	50 000	45 000	235 000	-	50 000
1	-	-	-	+50 000	-	+ 50 000	-
2							
3							
4							
5							

(ආ) 2025 මාර්තු 31 දිනට පහත අයිතමවල අගය සොයන්න.

(1) ජංගම වත්කම්

(2) ජංගම නොවන වත්කම්

(3) ජංගම වගකීම්

(4) හිමිකම (ල.04)

(iv) පහත දැක්වෙන ගනුදෙනු සැලකිල්ලට ගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) 01/05 රු. 50 000 ක භාණ්ඩ කමල්ට ණයට විකිණීම.

(2) 01/10 රු. 20 000 ක බැංකු ණය ආපසු ගෙවීම.

(3) 01/12 රු. 5 000 ක සේවක වැටුප ගෙවීම.

(4) 01/20 රු. 7 500 ක කොමිස් ආදායමක් ලැබීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගනුදෙනුවේ ද්විත්ව සටහන වටිනාකම සහිතව ලියා දැක්වීම.

(ආ) ඉහත අංක 01, 02 ගනුදෙනු ලෙජර් ගිණුම් වල සටහන් කර දැක්වීම. (ල. 04)

(මුළු ලකුණු 12)

PAST PAPERS WIKI

06. (i) මුදල් පොතේ ද්විත්ව කාර්යයන් නම් කරන්න. (ල.02)

(ii) ව්‍යාපාරයක සිදු වූ පහත ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වෙන වෙනම ලියන්න.

(අ) රු. 10 000 ක වෙළඳ භාණ්ඩ ණයට විකිණීම.

(ආ) රු. 100 000 ක යන්ත්‍රයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ණයට මිලදී ගැනීම. (ල.02)

(iii) සාරංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3 000 කි. 2025 මාර්තු මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත දැක්වේ.

දිනය	විස්තරය	වටිනාකම (රු.)
2025/03/01	අග්‍රිමය ලැබීම	3 000
2025/03/02	තැපැල් ගාස්තු ගෙවීම (ව/අ : 01)	250
2025/03/08	ගමන් ගාස්තු ගෙවීම (ව/අ : 02)	850
2025/03/15	සංග්‍රහ වියදම් ගෙවීම (ව/අ : 03)	1 200
2025/03/28	ක්‍රීරෝද රථ ගාස්තු ගෙවීම (ව/අ : 04)	400

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු සුළු මුදල් පොතක සටහන් කිරීම හා 2025/03/31 දිනට සුළු මුදල් පොත තුලනය කර දැක්වීම. (ල. 04)

(iv) නුවන්ගේ ව්‍යාපාරයේ 2025 මාර්තු මාසයේ ණයට විකුණුම් ගනුදෙනු පහත දැක්වේ.

2025/03/02 (ඉ:අංක 001) රු. 12 000 ක භාණ්ඩ අමල්ට ණයට විකිණීම.

2025/03/10 (ඉ:අංක 002) රු. 15 000 ක භාණ්ඩ කමල්ට ණයට විකිණීම.

අවශ්‍ය වන්නේ,

(අ) විකුණුම් ජ'නලය

(ආ) විකුණුම් ගිණුම (ල.04)

(මුළු ලකුණු 12)

07. (i) 2025/02/10 දින පේෂිලාගේ ව්‍යාපාරය තම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 50 000 ක් වටිනා උපකරණ ලිතුලිගෙන් ණයට ගත්තේ ය. මෙම ගනුදෙනුව අදාළ මූලික පොතේ සටහන් කර පෙන්වන්න. (ල.02)

(ii) 2024/12/31 දිනට නිපුන්ගේ ව්‍යාපාරයේ පහත සඳහන්ව ඇති ශේෂ ඇසුරෙන් ශේෂ පිරික්සුමක් පිළියෙල කරන්න. (ල.02)

	රු.
ගැණුම්	20 000
විකුණුම්	60 000
ණයගැතියෝ	12 000
ණය හිමියෝ	20 000
වැටුප්	15 000
යන්ත්‍ර	50 000
ගැනිලි	5 000
ප්‍රාග්ධනය	22 000

(iii) නිමිතෙරගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ දෝෂ කිහිපයක් පහත දැක්වේ.

(අ) රු. 10 000 ක් වටිනා විකුණුම් ඉන්වොයිසියක් මඟහැරීම.

(ආ) රු. 15 000 ක වැටුප් ගෙවීමක් මුදල් පොතේ පමණක් සටහන් කිරීම.

(ඇ) රු. 8 000 කට ලී බඩු මිලට ගැනීම ලී බඩු අලුත්වැඩියා කිරීමේ ගිණුමට හර කර තිබීම.

(ඈ) රු. 7 000 ක ණයට ගැනුම් අදාළ ගිණුම් දෙකේම බැර කර තිබීම.

අවශ්‍ය වන්නේ

(1) පොදු ජර්නලයක් තුළ ඉහත වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පිළියෙල කරන්න. (ල.04)

(2) අවිනිශ්චිත ගිණුම (ල.04)

(මුළු ලකුණු 12)

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01. (2)	02. (3)	03. (4)	04. (1)	05. (2)	06. (2)	07. (1)	08. (2)	09. (1)	10. (2)
11. (1)	12. (2)	13. (1)	14. (2)	15. (4)	16. (3)	17. (4)	18. (1)	19. (2)	20. (2)
21. (3)	22. (2)	23. (2)	24. (2)	25. (4)	26. (3)	27. (4)	28. (3)	29. (4)	30. (1)
31. (2)	32. (2)	33. (1)	34. (4)	35. (2)	36. (4)	37. (4)	38. (4)	39. (3)	40. (4)

II පත්‍රය

01. (i) (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර (ල.01)

(ආ) අයිතිකරුවෝ / අභ්‍යන්තර පරිසරයට (ල.02)

(ii) ''සරිත්මා'' ව්‍යාපාරය අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන නිසා එහි නාමය ලියාපදිංචි කළ යුතුය. (ල.02)

(iii) (අ) තිර රෙදි නිපදවීම පිළිබඳ අනුජ තුළ පවතින මනා පළපුරුද්ද හා දැනුම

(ආ) නිෂ්පාදිත වලට පවතින ඉහළ ඉල්ලුම (ල.02)

(iv) (අ)
- වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම.
- නෛතික පුද්ගල භාවයක් හිමි වීම.
- අඛණ්ඩ පැවැත්මක් තිබීම.
- වගකීම් සීමා සහිත වීම.
- අධ්‍යක්ෂ මණ්ඩයක් මඟින් කළමනාකරණය කිරීම. (ල.01)

(ආ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා (ල.01)

(v) <u>වත්කම්</u>

ඉඩම් ගොඩනැගිලි	2 000 000		
මෝටර් රථය	1 500 000		
තොගය	300 000		
මුදල්	175 000		
යන්ත්‍ර	250 000	4 225 000	(ල.½)
වගකීම්			
බැංකු ණය	800 000		
ණය හිමියෝ	60 000	(860 000)	(ල.½)
2025/01/01 හිමිකම		3 365 000	(ල.02)

(vi)

වත්කම්	=	හිමිකම්	+	වගකීම්	
4 225 000	=	3 365 000	+	860 000	(ල.02)

(vii) (අ) බැංකු ණය පොළී ගිණුම - හර 6 000

මුදල් ගිණුම - බැර 6 000 (ල.01)

(ආ)

බැංකු ණය පොළී ගිණුම			
මුදල්	6 000 (ල.½)		

මුදල් ගිණුම			
		බැංකු ණය පොළී	6 000 (ල.½)

(viii) (අ) මූලික සටහන් පොත - ගැනුම් ජර්නලය මූලාශ්‍ර ලේඛනය - ගැනුම් ඉන්වොයිසිය (ල.01)

(ආ) ජංගම නොවන වත්කම් - ඉඩම් ගොඩනැගිලි, මෝටර් රථ, යන්ත්‍ර ජංගම වත්කම් - තොගය, මුදල් (ල. 01)

(ix)

බැංකු ණය පොළී ගිණුම			
මුදල්	45 000 (½)	2025/1/31 ඉ/ගෙ ශේෂය	60 000
2025/1/31 ප/ගෙ ශේෂය	265 000 (½)	ගැනුම්	250 000
	310 000		310 000
		2025/1/31 ඉ/ගෙ ශේෂය	265 000

(ල.02)

(x) මුදල් පොත

(½)	2025 01/01 ඉ/ගෙ ශේෂය	175 000	ගැනුම්	180 000	
	විකුණුම්	420 000	සේවක වැටුප්	175 000	
			ණයහිමියෝ	45 000	(½)
			ණයපොලී	6 000	
			විවිධ වියදම්	65 000	
			2025/1/31 ප/ගෙ ශේෂය	124 000	(01)
		595 000		595 000	

2025/01/31 දිනට මුදල් ශේෂය රු. 124 000/- (ල.01) මුළු ලකුණු (2 x 10 = 20)

02. (i) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරන ඕනෑම කටයුත්තකි. (ල.01)

(ආ) • ලාභ උපරිම කිරීම

• පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම. (කරුණු 01 ල.01)

(ii) (අ) අසත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය (ල.½x4=02)

(iii) (අ) • ප්‍රාදේශීය ලේකම් වරයා

• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (ල.½x2=01)

(ආ) සුමුදු - අයිතිකරු / සේවකයන් / පළාත් සභාව (රජය) / බැංකුව (ල.½x2=01)

(iv) භූමිය - මිනිරන් පතල / ශ්‍රමය - සේවකයන්ගේ කායික ශ්‍රමය / ප්‍රාග්ධනය - යන්ත්‍රය / ව්‍යවසාය - රංගනාථ නව යන්ත්‍රයක් හඳුන්වා දීම / හිමිකරු - රංගනාථ (ල.½x4=01)

03. (i) (අ) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ බලවේග ක්‍රියාත්මක වන වට පිටාව ව්‍යාපාර පරිසරයයි. (ල.01)

(ආ) අභ්‍යන්තර පරිසරය / බාහිර පරිසරය (ල.01)

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) සත්‍ය (ඊ) අසත්‍ය (ල.½x4=02)

(iii) (අ) ආර්ථික පරිසරය (ල.01)

(ආ) භාණ්ඩ හා සේවා අලෙවිය තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම. (ල.01)

(iv) (අ) ලෝකයේ රටවල් අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් අන්‍යෝන්‍ය බැඳීමයි. (ල.01)

(ආ) හිතකර බලපෑම් :- • නවීන තාක්ෂණය ලබා ගත හැකි වීම. • ගුණාත්මක විදේශ අමුද්‍රව්‍ය ලැබීම • විදේශ ප්‍රාග්ධනය (තවත් පිළිතුරු ඇත.) (ල.½)

අහිතකර බලපෑම් :- • දැඩි තරඟකාරීත්වය • පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදීයාම • දේශීය සංස්කෘතිය පිරිහීම (තවත් පිළිතුරු ඇත.) (ල.½)

04. (i) පෞද්ගලික අංශය පොදු අංශය (සුදුසු උදාහරණයකට ලකුණු ලබාදෙන්න.) (ල.02)

(ii) (අ) සත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) අසත්‍ය (ල.½x4=02)

(iii) (අ) සහන් - තනි පුද්ගල ව්‍යාපාර / ලවන් - හවුල් ව්‍යාපාර

(ආ) ගණකාධිකාරීවරුන් / විගණකවරුන් / නීතීඥයින් / බදු නිළධාරීන් / වෛද්‍යවරුන් (ල. 02)

(iv) (අ) • අරමුණ අනුව

• පරිමාණය අනුව

• කළමනාකරණ කටයුතු සිදුකරන්නේ කවුරුන්ද යන්න අනුව (ල. 01)

(ආ) • අයිතිකරුගේ මූල්‍ය ශක්තිය
• කුසලතා හා පළපුරුද්ද
• විවිධ සබඳතා
• ව්‍යාපාරය නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය
• නිෂ්පාදනයට අදාල වෙළඳපොළ කොටස (ල. 01)

05. (i) ව්‍යාපාර ඒකක කෙරෙහි ඇල්මැති පාර්ශව වලට තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීම (ල.02)

(ii) • අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.
• ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම.
• අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම. (ල.02)

(iii) (අ)

ගනුදෙනුව	වත්කම				=	+ වගකීම්	
3/1 ශේෂය	යන්ත්‍ර	තොගය	ණයගැති	මුදල්	හිමිකම්	බැංකු ණය	ණයහිමි
01	150 000	40 000	50 000	45 000	235 000	.	50 000
02	.	.	.	+50 000	.	+50 000	.
03	.	.	(.10 000)	+10 000	.	.	. (½)
04	.	+25 000	.	.	.	.	+25 000 (½)
05	.	(.15 000)	.	+20 000	+5 000	.	. (½)
				(.2 000)	(.2 000)	(½)	
	150 000	50 000	40 000	123 000	238 000	50 000	75 000

(ල.02)

(ආ) ජංගම වත්කම් - 213 000
ජංගම නොවන වත්කම් - 150 000
ජංගම වගකීම් - 75 000
හිමිකම් - 238 000 (ල.½x4=02)

(iv) (අ)

(1)	ණයගැති ගිණුම (කමල්)	හර	50 000	
	විකුණුම් ගිණුම	බැර		50 000
(2)	බැංකු ණය ගිණුම	හර	20 000	
	මුදල් ගිණුම	බැර		20 000
(3)	වැටුප් වියදම් ගිණුම	හර	5 000	
	මුදල් ගිණුම	බැර		5 000
(4)	මුදල් ගිණුම	හර	7 500	
	ලද කොමිස් ගිණුම	බැර		7 500

(ල.½x4=02)

ණයගැති ගිණුම

01/05 විකුණුම්	50 000		

විකුණුම් ගිණුම

		01/05 ණයගැති	50 000

බැංකු ණය ගිණුම

01/10 මුදල්	20 000		

මුදල් ගිණුම

		01/10 බැ/ණය	20 000

(ල.½x4=02)

06. (i) මූලික පොතක කාර්ය
ලෙජර් ගිණුමක කාර්ය (ල.02)

(ii) (අ) විකුණුම් ඉන්වොයිසිය - විකුණුම් ජ'නලය

(ආ) ජ'නල් වවුචරය - පොදු ජ'නලය (ල.02)

(iii) සුළු මුදල් පොත

ලැබීම්	ස/පි	දිනය	විස්තරය	ව.අ.	ගෙවීම් (රු.)	විශ්ලේෂණ තීරු: තැපැල්	ගමන්	සංග්‍රහ	ලෙ.ගි.	ලෙ.පි.
3 000 (½)		03/01	මුදල් පොත							
		03/02	තැපැල් ගාස්තු	01	250	250	.	.	.	
		03/08	ගමන් ගාස්තු	02	850	.	850	.	.	
		03/15	සංග්‍රහ වියදම්	03	(½) 1200	.	.	1200	.	
		03/28	ත්‍රී රෝද රථ ගාස්තු	04	400	.	400	.	.	
					2 700	250	1250	1200	.	
		03/31	ප/ගෙ/ ශේෂය		(½) 300	(½)	(½)	(½)		
3 000					3 000					
3 000	(½)	04/01	ඉ/ගෙ/ශේෂය							

(ආකෘතියට ල.½)
(ල.04)

(iv) විකුණුම් ජර්නලය

දිනය	ඉන්වොයිසි අංකය	ගණුදෙනුකරු (ගැණුම්කරු)	මුළු වටිනාකම	ලෙ. පි.
25/03/02	001	අමල්	12 000 (1)	
25/03/10	002	කමල්	15 000 (1)	
25/03/31		විකුණුම් ගිණුමට බැර කළ	27 000	(½)

(ආකෘතියට ල.½)

විකුණුම් ගිණුම

	25/3/31 ණය ගැති ගිණුම	27 000

(ල.04)

07. (i) පොදු ජ'නලය

දිනය	ව.අ.	විස්තරය	ස.පි.	හර රු.	බැර රු.
2025/12/10		උපකරණ ගිණුම		50 000	
		ලිතුලි ගිණුම			50 000
		(ලිතුලිගෙන් උපකරණ ණයට ගැනීම ගිණුම්ගත කිරීම)			

(ල.02)

(ii) නිපුන්ගේ ව්‍යාපාරය

2024/12/31 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	හර රු.	බැර රු.
ගැනුම්	20 000	
විකුණුම්		60 000
ණයගැතියෝ	12 000	
ණයහිමියෝ		20 000
වැටුප්	15 000	
යන්ත්‍ර	50 000	
ගැනිලි	5 000	
ප්‍රාග්ධනය		22 000
	102 000	102 000

(ල.02)

(iii) (අ) පොදු ජ'නලය

	දිනය	විස්තරය	හර රු.	බැර රු.
(1)		ණයගැති ගිණුම විකුණුම් ගිණුම (විකුණුම් ඉන්වොයිසියේ මගහැරීමේ වරද නිවැරදි කිරීම)	10 000	10 000
(2)		වැටුප් ගිණුම අවිනිශ්චිත ගිණුම (වැටුප් ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම නිසා සිදු වූ වරද නිවැරදි කිරීම)	15 000	15 000
(3)		ලී බඩු ගිණුම ලී බඩු අලුත්වැඩියා ගිණුම (ලී බඩු මිලට ගැනීම අලුත්වැඩියා ගිණුමේ සටහන් වීමේ වරද නිවැරදි කිරීම)	8 000	8 000
(4)		ගැනුම් අවිනිශ්චිත (ණයට ගැනුම් ගිණුම් දෙකේම බැරට සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම)	14 000	14 000

(ල.04)

(ආ)

අවිනිශ්චිත ගිණුම

ශේෂ පිරික්සුමේ වෙනස	29 000		
		වැටුප්	15 000
		ගැණුම්	14 000
	29 000		29 000

(ල.04)
(මුළු ලකුණු 12)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank